# ඓතිහාසික තිඹිරිය පුරාණ රජමහා විහාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**බන්දුසේන පී.ටී.එස්.එස්,[1]තශ්මිලා ඒ.ටී.ඒ.එන්.[2]**

ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් තිඹිරිය පුරාණ රජමහා විහාරය මොනරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිඹිරිය ග්‍රාමයේ පිහිටා ඇති ඉපැරණි විහාරස්ථානයකි. මෙම විහාරයේ ඉතිහාසය අනුරාධපුර යුගයේ මුල් භාගයට අයත් බව එම විහාරස්ථානයෙන් හමු වන පුරාවිද්‍යාත්මක සාධක මගින් පිළිබිඹු කරයි. තිඹිරිය පුරාණ රජමහා විහාර භූමියෙන් හමු වන පුරාවිද්‍යාත්මක සාධක මොනවා ද? එම පුරාවිද්‍යාත්මක සාධක එම විහාරයේ ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමේ දී කොතෙක් වැදගත් වූවා ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය සිදු කිරීමේ අරමුණ වේ. මේ පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනයේ දී තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේද යොදා ගන්නා ලදී. මෙහි දී ක්ෂේත්‍ර ගවේෂණය වැඩි වශයෙන් යොදා ගත් අතර, එමගින් විහාරස්ථානයෙන් හමු වන පුරාවිද්‍යාත්මක සාධක පිළිබඳ තොරතුරු රැසක් මෙමඟින් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබිණි. තිඹිරිය පුරාණ රජ මහා විහාරයෙන් හමු වන සුවිශේෂී පුරාවිද්‍යාත්මක සාධක අතර, ඉපැරණි දාගැබ, ඉපැරණි ධර්මශාලාව, දැනට ගරා වැටෙමින් තිබෙන ආවාස ගෙය, ප්‍රතිමා ගෘහය යනාදිය ඉතා වැදගත් වේ. පුරාවෘත්තවලට අනුව ක්‍රි.පූ. 250-210 කාලය අතර දී අනුරාධපුර යුගයේ පාලනය ගෙන ගිය දෙවනපෑතිස් රජුගේ කාලයට අයත් යැයි සැලකෙන මෙම විහාරයෙන් හමු වන තවත් පුරාවිද්‍යාත්මක සාධක අතර ඕලන්ද කාසි එකසිය හැටක්, තඹ, පිත්තල, මුදු, වීදුරු, පළිඟු කරඬු, කේතුක, පැරණි මැටි බඳුන් ආදියත් අනුරාධපුර අවධියට අයත් නටඹුන් වූ ගොඩනැගිලි, ටැම්පිට විහාරයක් ද තිබුණු බවට තොරතුරු මෙම විහාර භූමියෙන් හමු වේ. එමෙන් ම මෙම විහාරස්ථානයෙහි මහනුවර යුගයට අයත් යැයි සැලකෙන සිතුවම්, මූර්ති හා කැටයම් සහිත දැව නිර්මාණ, අනුරාධපුර සමයට අයත් සෙල්ලිපියක් ද මෙම විහාර භූමියෙන් හමු වී ඇති බවට සාධක ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ තිඹිරිය රජ මහා විහාරයෙන් හමු වන පුරාවිද්‍යාත්මක සාධක මගින් එම විහාරයේ ඉතිහාසය මනාව ප්‍රතිනිර්මාණය කිරීමක් සිදු කළ හැකි බව යි. මේ ආකාරයට මෙමඟින් පැහැදිලි වන්නේ මොනරාගල දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබෙන ඉතා සුවිශේෂීවූත්, පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් විහාරස්ථානයක් ලෙස තිඹිරිය පුරාණ රජ මහා විහාරය හැඳින්විය හැකි බව යි. මෙම පුරාවිද්‍යාත්මක සාධක සියල්ල ම ආරක්ෂා කරගැනීම අප කාගේත් සතු වගකීමකි.

**ප්‍රමුඛ පද :** තිඹිරිය පුරාණ රජමහා විහාරය, ඉපැරණි, ඉතිහාසය, පුරාවිද්‍යාත්මක සාධක, ප්‍රතිනිර්මාණය

[1,2] භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. subhashinirusl@gmail.com